# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2263/39 - 2022 ජනවාරි මස 21 වැනි සිකුරාදා - 2022.01.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 03/ජේ/79/ඊ/462.
*යොමු අංකය*: කඹු/ඉඅ/3281.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තරය* :-

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 330-B මගමුරේ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මු. පි. මාර 1873හි පෙන්නුම් කරන පහත සඳහන් ඉඩම් කොටස් :

**කැබලි අංක 01**
ඉඩමේ නම: කඩවතගෙවත්ත; විස්තරය: හේන, අවු. 15ක් වයසැති කුරුඳු වගාවක් ඇත; හිමිකම් කියන අය: ජිනදාස, වෙල්ලප්පිලි, නාරන්දෙනිය, කඹුරුපිටිය; ප්‍රමාණය: හෙක්. 0.783.

**කැබලි අංක 02**
ඉඩමේ නම: කඩවතගෙවත්ත; විස්තරය: හේන, අවු. 15ක් වයසැති කුරුඳු වගාවක් ඇත; හිමිකම් කියන අය: ඒ. එස්. ජයවර්ධන, මැදගොඩ, කඹුරුපිටිය; ප්‍රමාණය: හෙක්. 0.527.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 පෙබරවාරි මස 14 වැනි දින පූ. භා. 10.30ට කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022 පෙබරවාරි මස 07 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඇති ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

කුසලක නානායක්කාර,
ප්‍රාදේශීය ලේකම්,
කඹුරුපිටිය.

2022 ජනවාරි මස 16 වැනි දින,
කඹුරුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 01 - 0226